# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,256 - 2021 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2021.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2284 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2294 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 දෙසැම්බර් මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


2281 - B 82291 — 5,403 (2021/11)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සඳහා වන සීමිත බඳවා ගැනීම - 2021

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරු 01 ක පවතින පුරප්පාඩුව සඳහා සීමිත බඳවා ගැනීම යටතේ, මෙහි පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම්*

1.1. අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :

I. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි පන්තියේ නිලධාරියෙකු වීම.

*හෝ*

II. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ I ශ්‍රේණියට උසස් කරනු ලැබ තිබීම.

*හෝ*

III. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ II ශ්‍රේණියට උසස් කරනු ලැබ තිබීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් ක්‍රීඩා හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

*හෝ*

IV. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරක හෝ තනතුරුවල වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

*සටහන:* අංක 1986/2 දරන හා 2016.09.26 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තිය යටතේ අන්තර්ග්‍රහණය කරනු ලැබ සිටින නිලධාරීන්ට අදාළව ඉහත 1.1 (I), (II) හා (III) මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අදාළ පන්තියට/ශ්‍රේණියට පත්වූ/උසස් වූ දිනය ලෙස සලකනු ලබන්නේ එකී 14 වැනි වගන්තියේ විධිවිධාන අනුව අදාළ පන්තියට/ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබීමට සුදුසුකම් සම්පූර්ණ කළ දිනය වේ.

1.2. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.3. *වෙනත් සුදුසුකම්* :

I. තනතුර ස්ථිර කර තිබීම.
II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම.
IV. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලබා ගෙන තිබීම.
V. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට ඉහත දක්වා ඇති සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

02. *වයස* : අදාළ නොවේ.

03. *වැටුප* : 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු. 47,615- 10x1,335-08x1,630 - 17x2,170 - රු.110,895/= (SL-1- 2016)වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමි වේ.

04. *සේවය නියුක්ත කරවීමේ කොන්දේසි* :

I. මෙම පත්වීම ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරට පත්වීම ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාලසීමාවකට යටත් වේ.

III. සෑම පත්වීමක්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1986/2 දරන හා 2016.09.26 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ වූ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද , රජයේ මුදල් රෙගුලාසිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද ඒවාට දැනටමත් සිදු කර ඇති හා ඉදිරියේදී සිදු කරනු ලැබිය හැකි සංශෝධනවලටද යටත්ය.

05. *බඳවා ගන්නා ක්‍රමය* :
අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලබයි. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පහත සඳහන් ලකුණු දීමේ පටිපාටියට අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*විස්තරාත්මක ලකුණු පරිපාටිය* :

| | *ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. | අතිරේක සේවා පළපුරුද්ද :<br>ඉහත 1.1 ඡේදයේ අදාළ මූලික සුදුසුකම සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සේවා ගණය / ශ්‍රේණිය අනුව බර තැබූ සේවා කාලය පහත පරිදි ගණනය කරනු ලැබේ.<br>(ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 සේවා ගණයේ සේවා කාලය) + 1.25 X (ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ III ශ්‍රේණියේ සේවා කාලය) + 2.00 X (ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ II ශ්‍රේණියේ සේවා කාලය)+ 2.10 X (ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ I ශ්‍රේණියේ සේවා කාලය) + 2.20 X (ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධි පන්තියේ සේවා කාලය)<br><br>ඉහත පරිදි ගණනය කරන ලද ඉහළම බර තැබූ සේවා කාලය හිමි අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී සෙසු අයදුම්කරුවන්ගේ බර තැබූ සේවා කාලයන්ට ඊට සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>• *සටහන* : මෙහි "සේවා කාලය" යන්නෙන් සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අදහස් වන අතර, සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තිය අනුව මෙහි ඉහත 1.1 ඡේදයේ සඳහන් එක් එක් සේවා ගණයේ ශ්‍රේණියට / පන්තියට අනුරූප අන්තර්ග්‍රහණයට පෙර පැවති තනතුරෙහි/තනතුරෙහි අදාළ වැටුප් හිමිවූ සේවා කාලය ද ඇතුළත් වේ. | 30 |

| | *ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 02. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු, ක්‍රීඩා කළමනාකරණය හෝ ක්‍රීඩා පරිපාලනය පිළිබඳ<br>i. පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 25<br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා - ලකුණු 20<br>iii. උපාධිය සඳහා - ලකුණු 15<br>iv. ඩිප්ලෝමාව සඳහා (මාස 06ට නොඅඩු) - ලකුණු 10<br>v. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03කට නොඅඩු) - ලකුණු 05<br>* **සටහන** I : ඉහත 1.1 ඡේදය යටතේ මූලික සුදුසුකමක් ලෙස සලකා බලන ලද කිසිම සුදුසුකමකට ලකුණු ලබා දෙනු නොලැබේ.<br>* **සටහන** II : ඉහත සියලු සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශ පුහුණු ආයතනයකින් ලබා තිබිය යුතුය.<br>* **සටහන** III : අර්ධ කාලීන පාඨමාලා සඳහා ලකුණු ලබාදීමේදී පූර්ණ කාලීන වර්ෂයක පාඨමාලාවකින් අධ්‍යයන පැය 1500 ක් ආවරණය කරන ලෙස සලකා ලකුණු ගණනය කෙරෙනු ඇත. | 25 |
| 03. | පුහුණුකරු තනතුරේදී සහ මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුරේදී දක්වන ලද විශේෂ දක්ෂතාවන්<br>I. පුහුණුකරුවකු හෝ පරිපාලකවරයකු හෝ කළමනාකරුවකු හෝ විනිශ්චයකරුවකු ලෙස සහභාගී වී ඇති අවස්ථා සඳහා<br>i. ඔලිම්පික් තරගාවලිය/පැරාලිම්පික් තරගාවලිය - ලකුණු 08 බැගින්<br>ii. පොදු රාජ්‍ය මණ්ඩලීය/ ලෝක ශූරතා/ පැරා ලෝක ශූරතා තරගාවලිය - ලකුණු 07 බැගින්<br>iii. ආසියාතික / පැරා ආසියාතික තරගාවලිය - ලකුණු 05 බැගින්<br>iv. දකුණු ආසියාතික ක්‍රීඩා උළෙල / ආසියානු ශූරතාවලිය - ලකුණු 03 බැගින්<br>v. ජාතික මට්ටමින් (ජාතික මහා ක්‍රීඩා උළෙල, ජාතික ශූරතා - ක්‍රීඩා සංගම්) - ලකුණු 02 බැගින්<br>* උපරිම අවස්ථා (02) ක් සඳහා පමණක් ලකුණු ලබාදේ.<br>* මේ පිළිබඳව සනාථ කළ හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | 16 |
| | II. 230 B දරන පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 04 | 04 |
| 04. | අමතර වෘත්තීය සුදුසුකම් :<br>ක්‍රීඩා හෝ පරිපාලන ආශ්‍රිත විෂයන් පිළිබඳව හදාරන ලද පාඨමාලා<br>දේශීය :<br>1. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>2. මාස 06 ක් හෝ ඊට වැඩි - ලකුණු 07<br>3. සති 02 කට වඩා වැඩි - ලකුණු 05<br>4. සති 02 කට වඩා අඩු දින 02 ට වැඩි - ලකුණු 03<br>* **සටහන** I : ඉහත 01 වගන්තියේ අතිරේක අධ්‍යාපන සුදුසුකම් යටතේ ලෙස සලකා බලන ලද කිසිම සුදුසුකමකට ලකුණු නොලැබේ<br>* **සටහන** II : ඉහත සියලු සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශීය පුහුණු ආයතනයකින් ලබා තිබිය යුතුය.<br>* **සටහන** III : අර්ධ කාලීන පාඨමාලා සඳහා ලකුණු ලබාදීමේදී පූර්ණ කාලීන වර්ෂයක පාඨමාලාවකින් අධ්‍යයන පැය 1500 ක් ආවරණය කරන ලෙස සලකා ලකුණු ගණනය කෙරෙනු ඇත. | 20 |

| | *ශීර්ෂය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 05. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා :<br>නායකත්වය 02<br>පෞරුෂය 02<br>සන්නිවේදනය 01 | 5 |
| | *එකතුව* | 100 |

*සැ.යු.*- ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරකට බඳවා ගැනීමේදී/සේවයේ උසස් කිරීමකදී/කාර්යක්ෂමතා කඩඉමකින් සමත්වීමේ දී දැනටමත් සලකා බලා ඇති සහතික/සුදුසුකම් සඳහා නැවත ලකුණු ලබාදෙනු නොලැබේ. ඉහත 01 සිට 04 දක්වා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වලංගු විය යුතුය.

06. ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22 X 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළවන පිටුවට ද, අංක 08 සිට දෙවන පිටුවටද වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති නියමිත දිනය පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021.12.25** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක : 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සඳහා වන සීමිත බඳවා ගැනීම - 2021" ලෙස සඳහන් කළ යුතුය.

***සැලකිය යුතුය*** - (*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.
(*ආ*) ඉල්ලූ අවස්ථාවලදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

07. සාවද්‍ය තොරතුරු සැපයීම
ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධිවිධාන මෙන්ම විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

09. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුරාධ විජේකෝන්
ලේකම්,
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

## තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ (SL- 01-2016) III වන ශ්‍රේණියේ සහකාර (ක්‍රීඩා) අධ්‍යක්ෂ තනතුරට සීමිත පදනමින් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01.

(I) මුලකුරු සමඟ අගට යෙදෙන නම :

(අ) (සිංහලෙන්) : ..........................................................................................................

(ආ) (ඉංග්‍රීසියෙන්) : ..........................................................................................................

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම් :

(අ) (සිංහලෙන්) : ..........................................................................................................

(ආ) (ඉංග්‍රීසියෙන්) : ..........................................................................................................

02.

(I) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................

(II) කාර්යාලීය ලිපිනය : ..........................................................................................................

(III) දුරකථන අංකය : ජංගම : ............................ කාර්යාලීය : ............................

03. ස්ත්‍රී / පුරුෂ භාවය :

අදාළ කොටුව තුළ ලියන්න

පුරුෂ - 0

ස්ත්‍රී - 1 ☐

04. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................

05. උපන් දිනය : වර්ෂය : ......................... මාසය : ................ දිනය : ................

06. 2021........... දිනට වයස : වර්ෂ : ........................ මාස : ............... දින : ...............

07. (අ) අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 1.1 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද? ....................................................................

(ආ) *ගැසට්* නිවේදනයේ 01 ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 1.1 හි I, II, III හා IV යන සුදුසුකම් අතරින් කුමන සුදුසුකම යටතේ ද යන්න. (ප්‍රථමව සම්පූර්ණ කර ඇති සුදුසුකම ඇතුළත් කළ යුතුය.) ....................

(ඇ) සුදුසුකම් ලබන්නේ 1.1 හි III හෝ IV යටතේ නම් පහත තොරතුරු ඉදිරිපත් කරන්න.

I. ලබා ඇති උපාධිය : ..................................................................................

II. උපාධිය වලංගු දිනය : ............................................

III. විශ්ව විද්‍යාලය / ආයතනය : ............................................

IV. ලියාපදිංචි අංකය : ............................................

V. බාහිර ද / අභ්‍යන්තර ද යන්න : ............................................

VI. හදාරා ඇති විෂයන් : ............................................

(ඈ) දැනට දරන තනතුර : .................................................. ශ්‍රේණිය : ..................................

(ඉ) එම තනතුරට පත්වූ දිනය : ........................... එම තනතුරේ ස්ථිර කළ දිනය : .........................

(ඊ) වැටුප් කේත අංකය සහ වැටුප් පරිමාණය : .......................................

08. කාර්යක්ෂමතා කඩඉම් :

| *කාර්යක්ෂමතා කඩඉම්* | *සමත් වීමට නියමිත දිනය* | *සමත් වූ දිනය* | *සහන කාලයක් ලැබී ඇත්නම් එම සහන කාලය හා සහන කාලය ලබා දුන් ලිපියේ දිනය හා අංකය* | *නිදහස් කර ඇත්නම් නිදහස් කිරීමේ ලිපියේ අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

09. අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු විස්තර :

| වැටුප් රහිතද, අඩ වැටුප් ද යන්න | ආරම්භ වූ දිනය | අවසන් වූ දිනය | කාල සීමාව (අවු. මාස හා දින) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී හෝ විනයානුකූල දඬුවමකට යටත්ව ඇත්ද? ඔව්/ නැත

11. ඉහත "10" ට පිළිතුර "ඔව්" නම්,
විනය නියෝගයේ අංකය හා දිනය ............................................................

12. සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවල දක්වන්න :

12.1. අංක 1986/2 දරන 2016.09.26 දිනැති සේවා ව්‍යස්ථාවට අන්තර්ග්‍රහණයෙන් පසු,

| අනු අංකය | සේවය / ශ්‍රේණිය | පත් වූ / උසස් වූ / අන්තර්ග්‍රහණය වූ දිනය | සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අවු. : මාස : දින |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12.2. අංක 1986/2 දරන 2016.09.26 දිනැති සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයට පෙර,

| අනු අංකය | සේවය / ශ්‍රේණිය | පත් වූ / උසස් වූ / අන්තර්ග්‍රහණය වූ දිනය | සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අවු. : මාස : දින |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම් | ලබා ගත් විශ්වවිද්‍යාලය/ ආයතනය | වලංගු වන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. **පුහුණුකරු තනතුරේ හා මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද විශේෂ දක්ෂතාවයන් :**
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

15. **අමතර වෘත්තීය සුදුසුකම් :**
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

16. **පහත තොරතුරු සනාථ කරන්න :**
   I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇත / නැත;
   II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව විනය දඬුවමකට ලක්වී ඇත / නැත;
   III. සේවා කාලය තුළ අඩ වැටුප් හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත / නැත.

17. **අයදුම්කරුගේ ප්‍රකාශය :**
මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම ඇතුළත් කර ඇති තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එසේ ඔප්පු වුවහොත් පත්වීම අවලංගු වීමට යටත් වන බව මම දනිමි.

දිනය : ................................ .........................................
අයදුම්කරුගේ අත්සන.

18. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** (අදාළ නොවන කොටස කපා හරින්න.)

01. පූර්වාසන්න වසර 05 තුළ මෙම නිලධාරියාට එරෙහිව විනය කටයුතු කිසිවක් සිදු කර ඇති ද? ඉදිරියේදී එසේ කිරීමට අදහස් කරන්නේද යන්න? ඔව් / නැත.

02. පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.
..........................................................................................................................................
..........................................................................................................................................

03. නිලධාරියාගේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේද? ඔව් / නැත.

04. පිළිතුර "ඔව්" නම් ලබා ගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.
..........................................................................................................................................
..........................................................................................................................................

මෙම නිලධාරියා අයදුම් පත්‍ර කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන ඇති / නැති බවත් සහතික කරමි.

මෙම දෙපාර්තමේන්තුවේ ...................................................................................... තනතුර දරන................................................ .................................. මයා / මිය / මෙය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ (SL - 01-2016) III වන ශ්‍රේණියේ සහකාර (ක්‍රීඩා) අධ්‍යක්ෂ තනතුරට අයදුම් කිරීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති/ නැති බැවින් මෙම අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

දිනය ................................... .....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.
නිල මුද්‍රාව

11-827

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**රත්නපුර දිස්ත්‍රික්කය**

අංක 2243 හා 2021.08.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-832

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**ගම්පහ දිස්ත්‍රික්කය**

අංක 2240 හා 2021.08.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-833

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**කොළඹ දිස්ත්‍රික්කය**

අංක 2240 හා 2021.08.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-834

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**කොළඹ දිස්ත්‍රික්කය**

අංක 2240 හා 2021.08.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-835

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**ගම්පහ දිස්ත්‍රික්කය**

අංක 2240 හා 2021.08.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-836

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම

**කළුතර දිස්ත්‍රික්කය**

අංක 2240 හා 2021.08.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-837

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

### ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රාදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ.පො.ස. (සා.පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන්ද (www.rgd.gov.lk) ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 දෙසැම්බර් මස 27 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

2021 නොවැම්බර් මස 05 වැනි දින.
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| ගාල්ල | බෝපේ පෝද්දල | කරාපිටිය මාතෘ රෝහල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

11-838

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO 9001:2015 නවතම තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

Sri Lanka Institute of Printing Opens the door to a rewarding Carrier in Printing, Graphics, Multi Media and Packaging Industry

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2020/2021**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසැල් හැර ගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ - 4 පාඨමාලාව**
**NVQ-4 Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබා දේ.

පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 04 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,750 0

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 4 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 14,250 0

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසැල් හැරග ිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 18,750 0 - NVQ - 4 සහතිකපත් පාඨමාලාව රු. 25,750 0

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 5 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,750 0

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨාමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,750 0

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,750 0

**නවතම 2018 වර්ෂයේ නිෂ්පාදිත වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණු කරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස් ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණ කරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : වසර 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,750 0

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : වසර 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 20,750 0

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,750 0

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Deisign for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,750 0

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

මෙම පාඨමාලවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 24,250 0

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් මුද්‍රණ ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,250 0

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ටද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 41,750 0

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
0777706995, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

**ශාඛා :**
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන අංක : 0662222172, 071 0554298.

11-711

---

**කම්කරු අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021

කම්කරු අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුරේ පවතින පුරප්පාඩු 60ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව සීමිත පදනම මත කම්කරු නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, එනම්, 2021.12.31 දිනට 02 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2022 වර්ෂයේ මාර්තු මස කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :
ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

02. සුදුසුකම් :

2.1 අධ්‍යාපන සුදුසුකම්/ වෘත්තීය සුදුසුකම්/ පළපුරුද්ද :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයකු වීම සහ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2016 හෝ ඊට

ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහ (05)කට නො අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(*ආ*) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2016 හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරකට වසර දහය (10)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

2.3 වෙනත් සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහ (05)ක කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහ (05)ක කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(iv) පූර්වාසන්න වසර පහ තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබීම.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

03. වයස් සීමාව : අදාළ නොවේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම විභාගයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට කම්කරු නිලධාරී - II ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත් ය.

(ii) මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට අනුශංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරී තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරා ගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු ය.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු. 34,605 - 10x660 - 11x755 - 15x930 - රු. 63,460 මාසික වැටුප් පරිමාණයක් හිමි ය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි MN-05-2016 වැටුප් කාණ්ඩය - එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.)

06. ලිඛිත විභාගය :

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. කම්කරු නීති | පැය 03 | 100 | 40 |
| 02. සිද්ධි අධ්‍යයනය | පැය 03 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රාජ්‍ය සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින්ම හෝ විය යුතු ය. එමෙන්ම අපේක්ෂකයෙකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

අපේක්ෂයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. කම්කරු නීති | පහත සඳහන් කම්කරු අණපනත් අළලා ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.<br>i. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත<br>ii. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත<br>iii. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත<br>iv. 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත<br>v. 1971 අංක 45 දරන සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත<br>vi. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත<br>vii. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත<br>viii. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත<br>ix. 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥාපනත<br>x. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 02. සිද්ධි අධ්‍යයනය | අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය සහ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂයා විසින් විසඳුම් ලබාදෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද ගැටලු යොමු කරනු ඇත. |

08. සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

*සැලකිය යුතු යි* :
සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

09. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 600/= කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයක් වෙත හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. *අයදුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) අයදුම්පත්, අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින්, අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 9.2 තෙක් පළමුවන පිටුවට ද, 10 සිට 13.10 තෙක් දෙවන පිටුවට ද, 13.11 සිට 15 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය 4 වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකි ය.

(*ආ*) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(*ඈ*) අයදුම්කරු දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියකු ලවා තම අත්සන සහතික කරවා ගත යුතු ය.

(*ඉ*) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021.12.31 දිනට පෙර යැවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "කම්කරු

දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාගයට පෙනී සිටීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂයකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ඈ) විභාග ප්‍රතිඵල -

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයෙන් ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ කුසලතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

***සටහන*** : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් නොවන බව සැළකිය යුතු ය.

13. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) ජාතික හැඳුනුම්පත
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති බව පෙනීයන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය *ගැසට්* නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

දිනය : 2021 නොවැම්බර් මස 15 වැනි දින.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021**

Limited Competitive Examination for Recruitment to the Post of Labour Officer - II in the Department of Labour - 2021

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.)

02. පෞද්ගලික තොරතුරු -

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................
උදාහරණය (SILVA A.B.D.P.A.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : ..................................................

03. 3.1 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
..................................................
..................................................

3.2 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..................................................
..................................................

3.3 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..................................................
..................................................

04. ස්ත්‍රී/පුරුෂභාවය : (පුරුෂ - 0, ස්ත්‍රී -1) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2) අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

08. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දීය දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

09. 9.1 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

9.2 2021.12.31 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

10. ඔබ 2021.12.31 දිනට සේවයේ යෙදී සිටින තනතුරට/ සේවයට/ ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/ සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න.
..................................................

11. 2021.12.31 දිනට *ගැසට්* නිවේදනයේ 02 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේ ද?
..................................................

12. අධ්‍යාපන සුදුසුකම් :
12.1 උපාධිය : ..................................................
12.2 විශ්වවිද්‍යාලය/ ආයතනය : ..................................................
12.3 සාමර්ථය (පන්ති සාමර්ථයක් ඇත්නම් සඳහන් කරන්න) : ..................................................
12.4 උපාධිය වලංගු දිනය : ..................................................
12.5 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ..................................................
12.6 නීතිඥයකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය : ..................................................
(අදාළ නම් පමණක් සඳහන් කරන්න)

13. පළපුරුද්ද :
13.1 විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් ඇත්නම්) සඳහන් කරන්න : ..................................................

13.2 දැනට දරන තනතුර : ........................................................................................................

13.3 එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න : .................................

13.4 ශ්‍රේණිය : ........................................................................................................................

13.5 පන්තිය/බණ්ඩය : ..............................................................................................................

13.6 තනතුරට පත් වූ දිනය : ......................................................................................................

13.7 එම තනතුරේ ස්ථිර කළ දිනය : ........................................................................................

13.8 වැටුප් කේත අංකය : ...........................................................................................................

13.9 වැටුප් පරිමාණය : ..............................................................................................................

13.10 අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කරන්න.

| *සේවයේ/ශ්‍රේණියේ නම* | *අදාළ රා.පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය* (උදා : MN - 1 -2016) | *පත් වූ දිනය* | *ස්ථිර කළ දිනය* |
|---|---|---|---|
| (1) ............................. | ............................. | ............................. | ............................. |
| (2) ............................. | ............................. | ............................. | ............................. |
| (3) ............................. | ............................. | ............................. | ............................. |
| (4) ............................. | ............................. | ............................. | ............................. |

13.11 *ගැසට්* නිවේදනයේ 02 වන ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2021.12.31 දිනට සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය :

14. විභාග ගාස්තු ගෙවීම -

14.1 ගෙවූ මුදල : ..........................................................................................................................

14.2 ගෙවන ලද තැපැල්/ උප තැපැල් කාර්යාලය : ..........................................................................

14.3 ගෙවූ දිනය : ..........................................................................................................................

14.4 ලදුපත් අංකය : ......................................................................................................................

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

15. අයදුම්කරුගේ සහතිකය :

2021.12.31 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 2.1 ඡේදයට අනුව 2021.12.31 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මම භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................................... හා .......................................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................... ........................................

දිනය අයදුම්කරුගේ අත්සන.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත් .................................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

දිනය: .................................... ....................................

(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.)

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :..........................................................................................
තනතුර : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................................
මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන/පළාත් සභාව යටතේ වන ..........................................................................................
අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .......................................................................................... තනතුරක සේවය කරන බව ද, 2021.12.31 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට්* නිවේදනයේ 2.1 වන ඡේදයට අනුව අවුරුදු .................................... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

දිනය : .................................... ....................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත් නිලධාරියාගේ අත්සන).

නම : ..........................................................................................
පදවි නාමය : ..........................................................................................
දිනය : ..........................................................................................
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුය)

11-735

---

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණයේ ප්‍රමාණ සමීක්ෂණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරෙහි පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ප්‍රමාණ සමීක්ෂණ සහකාර | 02 |

1. *වැටුප් පරිමාණය* :-
   1.1 වැටුප් කේත අංකය : MN - 3 2016
   1.2 වැටුප් පරිමාණය : රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - රු. 57,550 00

2. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

3. *අධ්‍යාපන සුදුසුකම්* :

- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ්‍යය සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම සහ
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

4. *වෘත්තීය සුදුසුකම්* :
තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ කාර්මික විද්‍යාලයකින් පිරිනමන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) හෝ හය (06) මට්ටමට ඇතුළත් වන්නා වූ ජාතික තාක්ෂණ (ප්‍රමාණ සමීක්ෂණ) සහතිකය ලබා තිබීම.

5. *පළපුරුද්ද* :
අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් කාර්මික ආයතනයක වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

6. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම්*
   I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු යුතු ය.
   II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
   III. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8. *වයස* :
   8.1 අවම සීමාව : අවු. 18ට නොඅඩු
   8.2 උපරිම සීමාව : අවු. 30 නොවැඩි
   (ඒ අනුව 2003.12.12 දිනට හෝ ඊට පෙර හා 1991.12.12 දිනට හෝ පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

9. *බඳවා ගැනීමේ ක්‍රමය* :-
ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්, කුසලතා අනුපිළිවෙළින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

10. *විභාගය* :-
   10.1 ලිඛිත විභාගය

| *විෂය අංකය* | *විෂය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය දැනීම හා අවබෝධය | පැය 01 යි | 100 | 40 |
| 02. | ප්‍රමාණ සමීක්ෂණය හා SLS 573 භාවිතය | පැය 03 යි | 100 | 40 |

(i) මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේ දී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) විභාග ගාස්තු රු. 600/-

දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයක් වෙත මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10.2 විභාග නිර්දේශය :

විෂය අංකය 01 - සාමාන්‍ය දැනීම හා අවබෝධය

| *විෂය නිර්දේශය* | *ප්‍රශ්න වල ස්වභාවය* |
|---|---|
| • ශ්‍රී ලංකාවේ භූ විෂමතා, ඉතිහාසය, දේශපාලනය, ක්‍රීඩා හා මෑත කාලයේ දී සිදු වූ වැදගත් සිදුවීම් (ජාත්‍යන්තරයේ ලබාගත් ජයග්‍රහණයන් ද ඇතුළුව)<br>• ලෝකයේ සිදු වූ වැදගත් සිදුවීම්, භූගෝලීය අනුව සිදුවන බෙදීම් ප්‍රධාන නගර, ජාත්‍යන්තර සංවිධාන හා ඒවායේ කාර්යභාරය | කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්න |

විෂය අංකය 02 - ප්‍රමාණ සමීක්ෂණය හා SLS 573 භාවිතය

| *අනු අංකය* | *විෂය නිර්දේශය* | *ප්‍රශ්න වල ස්වභාවය* |
|---|---|---|
| 1 | සම්මත ප්‍රමිතීන් (SLS 573) භාවිතයෙන් ප්‍රමාණ පත්‍ර සකස් කිරීම | අනිවාර්ය ප්‍රශ්න |
| 2 | ප්‍රමාණවල බිල සකස් කිරීම ආශ්‍රිත ගැටලු | |
| 3 | ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණ බිල්පත් සකස් කිරීම | අනු අංක 03-09 දක්වා ප්‍රශ්න 7න් ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සැපයිය හැක. |
| 4 | තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් ඇස්තමේන්තුකරණය | |
| 5 | ලංසු ලියකියවිලි සකස් කිරීම | |
| 6 | කොන්ත්‍රාත් කොන්දේසි (CIDA/SBD) භාවිතය | |
| 7 | ගෙවීම් ක්‍රියාවලිය සඳහා සාමූහික මිනුම් ලබා ගැනීම | |
| 8 | අතුරු සහ අවසන් ගිණුම් පරීක්ෂා කිරීම, කොන්ත්‍රාත් විචලනය | |
| 9 | ද්විමාන හා ත්‍රිමාණ සැලසුම් පිළිබඳ දැනුම | |

10.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

11. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :- අයදුම්පත මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල විය යුතු ය. 8 1/2x12 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පතෙහි අංක 01 සිට 05 තෙක් පළමු පිටුවට ද, ඉතිරිය සෙසු පිටුවලට ද සකස් කරගත යුතු ය. අයදුම්කරු විසින් අයදුම්පත විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පතේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. එසේම නිවේදනයෙ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත්කොට ලදුපත අලවා තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත 2021.12.20 දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණයේ ප්‍රමාණ සමීක්ෂණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ ඡායා පිටපත අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ ඉහත විස්තර හා විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

(iv) අපේක්ෂකයින් විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින පළමු දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(v) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු ශ්‍රී ලංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණු හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයින්ට සිදුවනු ඇත.

15. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛනය අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත.

16. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

17. *විභාග ප්‍රතිඵල* :- එක් එක් විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළට සකස් කළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව" වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ප්‍රසිද්ධ කරනු ඇත.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර,
කොලොන්නාව.

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණයේ ප්‍රමාණ සමීක්ෂණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

Open Compettitive Examination for Recruitments to the Post of Management Assistant Non Technical/ Technical Services Quantity Survey Assistant in the Department of Government Factory

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : | |
|---|---|
| සිංහල - 2<br>දෙමළ - 3<br>ඉංග්‍රීසි - 4 | ☐ |
| (අදාළ අංකය කොටුව තුළ ලියන්න)<br>මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. | |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.....................................................................................................................................
.....................................................................................................................................
(*උදා* : (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
: .....................................................................................................................................
(*උදා* : (GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

1.4 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

1.5 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

2.0 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..........................................................................................................................................
..........................................................................................................................................

3.0. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී -1
පුරුෂ -0
(අදාළ කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :.................................................................

3.4 විවාහක/අවිවාහක බව :.................................................................

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

5.0 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

6.0 අධ්‍යාපන සුදුසුකම් :

6.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :
වර්ෂය :.............................. මාධ්‍යය :..............................
විභාග අංකය :..............................

| *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|
| | |
| | |
| | |
| | |

6.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය
වර්ෂය :.............................. මාධ්‍යය :..............................
විභාග අංකය :..............................

| *විෂයය* | *සාමාර්ථ්‍යය* | *විෂයය* | *සාමාර්ථ්‍යය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

6.3 වෘත්තීය සුදුසුකම් : ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

6.4 පළපුරුද්ද : ..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

7.0 7.1 විභාග ගාස්තුව : ..........................................................................................
7.2 තැපැල්/ උප තැපැල් කාර්යාලය : ........................................................................
7.3 ලදුපත් අංකය : ..........................................................................................
7.4 දිනය : ..........................................................................................

| |
|---|
| විභාග ගාස්තුව රු. 600/- ක් වන අතර එම මුදල ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රු. ............ තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : ....................................

....................................
අයදුම්කරුගේ අත්සන.

***සටහන*** : අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

<u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..........................................................................(මහතා/ මහත්මිය/ මෙනවිය ........................................................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

........................................................
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම : ..............................................................
පදවි නාමය : .............................................
ලිපිනය : ......................................................
දිනය : ..........................................................

<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

..................................................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ස්ථිර නිලධාරියකු / නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

* අදාළ නොවන වචන කපා හරින්න.

.

........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම : ..............................................................
පදවි නාමය : .............................................
ලිපිනය : ......................................................
දිනය : ..........................................................

11-849

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.